C
371

PERMANENT REFERENCE

FOR USE IN THE
LIBRARY ONLY

# ගැටවර වියේ නාගරික පාසැල් ළමුන් ගේ මානසික අවශ්‍යතාවයන් පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයකි.

එච්. අලුමල්පොත
(බී.ඒ.; අධ්‍යා. ඩිප්. (සම්මාන)

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය සම්මාන්ට අවශ්‍යතා
අර්ධ වශයෙන් පූරණය කිරීම සඳහා
ඉදිරිපත් කෙරෙන
පර්යේෂණාත්මක නිබන්ධනයකි.

1982

නිබන්ධ උපදේශක :-

ආචාර්ය එම්.ඩූ.ජේදර
අධ්‍යාපන අංශය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

371926

## සා රා ං ශ ය

ආරක්ෂාව, ආදරය, පිළිගැනීම, නිදහස, බුද්ධිමත් දර්ශනයක එළඹීම හා ලිඛිත තොරතුරු දැනගැනීම යන තෝරාගත් මානසික අවශ්‍යතා හයක් වටා නාගරික පාසැල්වල ගැටවර ගැහැණු සහ පිරිමි ළමුන් ගේ වරණ හැසිරීම ද, ඒ ඒ අවශ්‍යතාව කෙරේ බෙහෙවින් බලපාන පුද්ගලයන් වශයෙන් මව, පියා, සොහොයුරන්, සොහොයුරියන්, මිතුරන්, මිතුරියන්, ඥාතීන්, ගුරුවරුන් හා පෙම්වතා/පෙම්වතිය යන නව දෙනා හා බැඳි වරණ හැසිරීම ද, පර්යේෂණාත්මක අධ්‍යයනයකට ලක් කෙරිණි.

පර්යේෂණය සඳහා මහනුවර නගරයේ පිරිමි පාසැල් අතුරින් ත්‍රිත්ව විදුහල සහ මහ/සාන්ත සිල්වෙස්තර මහා විදුහල ද, ගැහැණු පාසැල් අතරින් මහ/උසස් බාලිකා මහා විද්‍යාලය සහ මහ/පුෂ්පදාන බාලිකා මහා විද්‍යාලයද, මිශ්‍ර පාසැල් අතරින් මහ/ගැටඹේ මහා විද්‍යාලය සහ මහ/සෙංකඩගල මහා විද්‍යාලයද යොදා ගෙන, වයස අවුරුදු 14 – 17 දක්වා වයස් කලයන් හරහා, අහඹු ලෙස තෝරා ගත් ගැහැණු සහ පිරිමි ළමුන් 480 කින් යුක්ත නියෝජ්‍ය නියැදියක් යොදා ගනිමින් දත්ත රැස් කෙරිණ.

ගැටවර මානසික අවශ්‍යතා සහ ඒ කෙරේ බලපාන පුද්ගලයන් පිළිබඳව සොයා බැලීම සඳහා යසු පිළිවෙත සහ යුග්ම සැසඳුම් පිළිවෙත-(Paired Comparison Method) මෙහිදී භාවිතයට ගැනිණ. ස්පියර්මන් ගේ තරා සහසම්බන්ධතා සංගුණකය සහ කෙන්ඩල් ගේ අනුගමයතා සංගුණකය-(Co-efficient of Concordance) මගින් අවශ්‍යතා සහ පුද්ගලයන් පිළිබඳ සංඛ්‍යානාත්මක වෙසෙසියාව සොයා බැලිණ.

ග්‍රාමීය පාසැල්වල ගැටවර ගැහැණු සහ පිරිමි ළමුන් පිළිබඳ ජයසිංහ_ (1981) අධ්‍යයනයෙන් සෝයා ගත් තොරතුරු නාගරික අධ්‍යයනයෙන් ලබා ගන්නා තොරතුරු සමග කෙතෙක් දුරට සහසම්බන්ධතාවක් දක්වන්නේද යන්න ද සැලකිල්ලට ලක් කෙරිණ.

මෙම පර්යේෂණය පහත සඳහන් අනාවරණයන් වාර්තා කරයි.

1. තෝරා ගත් අවශ්‍යතා හය පිළිබඳ වරණ හැසිරීමේදී අවුරුදු 14, 15 සහ 17 ගැහැණු ළමුන් ඒකාකාරී රටාවක් පෙන්වන අතර

අවුරුදු 16 වෙනස් ආකාරයක රටාවක් පෙන්වයි.

2. අවශ්‍යතා සය පිළිබඳ වරණ හැසිරීම්හි දී වයස් කල කතරෙහිම පිරිමි ළමුන් ඒකාකාරී රටාවක් දක්වයි.

3. අවශ්‍යතා සය පිළිබඳ වරණ හැසිරීම්හි දී ගැහැණු යන පිරිමි ළමුන් අතර ඒකාකාරී බවක් නැත.

4. ඒ ඒ අවශ්‍යතාව පිළිබඳ බලපෑ හැකි පුද්ගලයන් පිළිබඳ වරණ හැසිරීම්හිදී සියළුම ගැහැණු ළමුන් ඒකාකාරී වරණ පිළිවෙලක් දක්වයි.

5. ඒ ඒ අවශ්‍යතා පිළිබඳ බලපෑ හැකි පුද්ගලයන් පිළිබඳ වරණ හැසිරීම්හිදී නිදහස හා ලිංගික අවශ්‍යතා ව කෙරේ බලපෑ හැකි පුද්ගලයන් පිළිබඳව අවුරුදු 16 පිරිමි ළමුන් වෙනස් රටාවක් දක්වයි.

6. අවශ්‍යතා පිළිබඳ බලපෑ හැකි පුද්ගලයන් පිළිබඳ වරණ හැසිරීම්හිදී ගැහැණු යන පිරිමි ළමුන් අතර ඉතා අඩු එකඟතාවක් ඇත.

7. අවශ්‍යතා පිළිබඳ වරණ හැසිරීම්හිදී ග්‍රාමීය හා නාගරික ගැහැණු ළමුන් අතර එකඟතාවක් ඇත. ග්‍රාමීය හා නාගරික පිරිමි ළමුන් අතර අවශ්‍යතා සය පිළිබඳ වරණ හැසිරීම්හිදී සැලකිය යුතු එකඟතාවක් නැත.

8. ග්‍රාමීය හා නාගරික ගැහැණු ළමුන් අවශ්‍යතා කෙරේ බලපෑ හැකි පුද්ගලයන් පිළිබඳ වරණ හැසිරීම්හි දැඩි එකඟතාවක් පෙන්වයි.

9. ග්‍රාමීය හා නාගරික පිරිමි ළමුන් අවශ්‍යතා සය කෙරේ බැඳි පුද්ගලයන් පිළිබඳ වරණ හැසිරීම්හි ලිංගික අවශ්‍යතාව පිළිබඳව හොඳ එකඟතාවක් නැත.

10. අවශ්‍යතා සය පිළිබඳ වරණ හැසිරීම්හි අවුරුදු 16 ග්‍රාමීය හා නාගරික ගැහැණු ළමුන් අතර එකඟතාව ඉතා අඩුය. එහෙත් අවශ්‍යතා සය පිළිබඳ වරණ හැසිරීම්හි අවුරුදු 16 ග්‍රාමීය හා නාගරික පිරිමි ළමුන් අතර හොඳ එකඟතාවක් ඇත.

11. නාගරික ගැහැණු ළමුන් මුද්විමක් දකිනයක් ලබා ගැනීමේ අවශ්‍යතාවට වැදගත්ම තැන පවරන අතර ලිංගික තොරතුරු දැන ගැනීමේ අවශ්‍යතාව අන්තිම අවශ්‍යතාව ලෙස සලකයි. නාගරික පිරිමි ළමුන්ගේ වැදගත්ම අවශ්‍යතාව ආදර අවශ්‍යතාව වන අතර ගැහැණු

ළමුන්ගේ මෙන්ම අන්තිම අවශ්‍යතාව ලිංගික තොරතුරු දැනගැනීමේ අවශ්‍යතාවයි.

12. ඒ ඒ අවශ්‍යතාව සඳහා බලපාන පුද්ගලයන් පිළිබඳ අනු පිළිවෙල බෙහෙවින් වෙනස් බැව් පෙනී යයි. ආදරය, ආරක්ෂාව හා පිළිගැනීම සඳහා තම පවුලේ පුද්ගලයන් වැදගත් වේ. මුද්ධිමත් දර්ශනය හා ලිංගික අවශ්‍යතාව හා නිදහස කෙරේ පවුලෙන් බැහැර පුද්ගලයන් වැදගත් වන බැව් ප්‍රකට වේ.